**ශීර්ෂය 252 - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 252- ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 සැප්තැම්බර් 01 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 1,287.24 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 1,036.04 ක් උපයෝජනය කර තිබුණි.ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 251.20 ක් හෙවත් සියයට 19.51 ක ප්‍රතිපාදන ඉතිරිව් තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 812.25 | 805.38 | 6.87 | 0.88 |
| මූලධන | 474.99 | 230.66 | 244.33 | 51.44 |
| **එකතුව** | **1,287.24** | **1,036.04** | **251.20** | **19.51** |

**2.2** **අත්තිකාරම් ගිණුම්**

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 25201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| 51.76 | 44.71 | 31.76 | 35.45 | 220.00 | 146.05 |

**2.3** **අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුවට අදාළ අංක 7002/0000/00/0037/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 4.96 ක් වී තිබුණි.

**2.4** **පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුවට අදාළ පොදු තැන්පත් ගිණුම් 03 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 32.83 ක් විය. විස්තර පහත දැක්වේ.

| **පොදු තැන්පත් ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.මිලියන** |
| 6000/0000/00/0002/0060/000 | 0.10 |
| 6000/0000/00/0016/0036/000 | 32.24 |
| 6000/0000/00/0018/0023/000 | 0.49 |
| **එකතුව** | **32.83** |

**2.5** **විගණන නිරීක්ෂණය**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

විගණනයට ඉදිරිපත් කළ රජයේ නිලධාරින්ට අතිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.712,337 ක් වූ අතර එම ශේෂයන් වර්ෂ 1 ක සිට වර්ෂ 24 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ 2015 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනිමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

### 3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| (i) V වන පරිච්ඡේදයේ 7.1 වගන්තිය හා 10 වැනි පරිශිෂ්ඨය ප්‍රකාර ගිවිසුමේ 2(iii) කොන්දේසිය | දිවයිනෙන් බැහැරව ගත කිරීම සඳහා අනුමත විදේශ නිවාඩු අවසන් වී තිබුණු නිලධාරින් 05 දෙනෙකු සේවයට වාර්තා කර නොතිබුණි. |
| (ii) XII වන පරිච්ඡේදයේ 16:5 වගන්තිය හා 10 වැනි පරිශිෂ්ඨය ප්‍රකාර ගිවිසුමේ 2(iv) කොන්දේසිය | විදෙස්ගත වී සේවයට වාර්තා නොකළ නිලධාරින් 05 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.2,251,600 ක දඩ මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

### 3.3 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

දෙපාර්තමේන්තු නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරිම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2011 නොවැම්බර් 16 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත රු.727,529,015 (බදු රහිත ) ක පිරිවැයකට නව ගොඩනැගිල්ල ඉදිරිකිරිම සඳහා 2012 මාර්තු 05 දින පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව 2014 ජනවාරි 30 දින වන විට ඉදිරිකිරීම් නිම කළ යුතුව තිබුණද, අවස්ථා 02 කදී කරන ලද කාලය දිර්ඝ කිරීම් අනුව එම දිනය 2014 නොවැම්බර් 30 දින දක්වා දීර්ඝ කර තිබුණි. 2015 ජනවාරි මාසයේදි දෙපාර්තමේන්තුව නව ගොඩනැගිල්ලේ ස්ථාපිත කර තිබුණු නමුත් ගොඩනැගිල්ල, දෙපාර්තමේන්තුව විසින් විධිමත් පරිදි භාර ගෙන නොතිබුණු හෙයින් ඉදි කිරීම් නිම කළ දිනය නිශ්චිතව අනාවරණය කර ගැනීමට නොහැකි විය.

(ආ) ගිවිසුම් ප්‍රකාරව ගෙවිය යුතු අනුමත පිරිවැය රු.727,529,015 ක් වුවත්, අවස්ථා 29 කදී එකතුව රු. 832,133,569 ක් 2014 වර්ෂයේදී කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. එම ගෙවීම්වලින් රු. 4,524,799 ක් තැන්පත් ගිණුමේ රඳවා තිබුණු අතර තවදුරටත්

ගෙවිය යුතු මුදල රු.138,926,105 ක් වි තිබුණි.. ඒ අනුව කොන්ත්‍රාත්තුවේ පිරිවැය අහිතකර විචලනය රු. 248,455,458 ක් හෙවත් සියයට 34.1 ක් වී තිබුණි.

(ඇ) ගොඩනැගිල්ල භාවිතා කිරීමේදී විදුලි පද්ධතියට හා විදුලි සෝපානයට වැසි ජලය කාන්දු වීම, පතුල් මාලයේ ජලය එක් රැස්වීම වැනි අඩුපාඩු අනාවරණය වී තිබුණි.

**3.4 කාර්යසාධනය**

----------------

2015 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2015 හතරවන කාර්තුව අවසාන වන විට ජන හා නිවාස සංගණනය - 2012 වාර්තාව සමස්ථ ශ්‍රී ලංකාව ආවරණය වන පරිදි සකස් කර නිම කිරීමට සැලැසුම් කර තිබුණද, එම කටයුතු අදාළ කාලපරිච්ඡේදය තුළ නිම කර නොතිබුණි.

(ආ) 2014/2015 වර්ෂයේදී ප්‍රජා විද්‍යා හා සෞඛ්‍ය සමීක්ෂණයේ සමීක්ෂණ කටයුතු නිම කර අවසන් වාර්තාව ප්‍රසිද්ධ කිරීමට සැලැසුම් කර තිබුණද, අවසන් වාර්තාව 2015 දෙසැම්බර් 31 දින වන විටත් නිම කර නොතිබුණි.

(ඇ) 2014 වාර්ෂික කර්මාන්ත සමීක්ෂණයේ වාර්තාව 2015 වර්ෂයේ 4 වන කාර්තුව අවසාන වන විට ක්ෂේත්‍රයේ කටයුතු නිම කිරීමට සැලැසුම් කර තිබුණද, එම කටයුතු නිම කර නොතිබුණි.

(ඈ) නිවාස හා ආයතන පිළිබඳ විශේෂ සමීක්ෂණය සඳහා රු.7,285,650 ක් ප්‍රතිපාදන සලසා තිබුණද , සමීක්ෂණයේ කටයුතු ආරම්භ කර නොතිබුණි. නිවාස හා ආයතන පිළිබඳ විශේෂ සමීක්ෂණය 2015 වර්ෂයේදි ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණද එය නොපවත්වා 2016 වර්ෂයේදී ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය පැවැත්වීමටත්, 2015 වර්ෂයේදී ඒ සඳහා වන සියළු මූලික කටයුතු එනම් ප්‍රශ්නාවලිය සැකසීම, මුද්‍රණය කිරීම, නිලධාරීන් පුහුණු කිරීම අවසන් කිරීමටත් තීරණය කරන ලද බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දන්වා එවා තිබුණි.

(ඉ) ආර්ථික සංගණනයට අදාළව කෘෂිකාර්මික ක්‍රියාකාරකම් පිළිබඳ සංගණනය කටයුතු නිම කිරීමට සැලැසුම් කර තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**3.5 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---------------------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 282 | 175 | 107 |
| (ii) | තෘතියික මට්ටම | 529 | 350 | 179 |
| (iii) | ද්විතියික මට්ටම | 786 | 684 | 102 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 176 | 151 | 25 |
| (v) | වෙනත් (උපාධිධාරී අභ්‍යාසලාභින්) | 3 | 1 | 2 |
| | **එකතුව** | **1,776** | **1,361** | **415** |